ඌව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
ஊவா மாகாண கல்வித் திணைக்களம்
UVA PROVINCIAL DEPARTMENT OF EDUCATION

# පෙරහුරු පරීක්ෂණය - 2017

**11 ශ්‍රේණිය** | **සිංහල භාෂාව හා සාහිත්‍යය II** | **කාලය පැය දෙකයි.**

සැලකිය යුතුයි :
- I සිට X තෙක් ඇති සියලුම අනු කොටස්වලට කෙටි උත්තර ලියන්න. කිසියම් අනු කොටසකට **උත්තර නොලියන්නේ නම් එහි අංකය ලියා ඉදිරියෙන් ඉරක් අඳින්න.**

---

**01.** I. පහත සඳහන් පදවල අරුත් පැහැදිලි වන සේ වාක්‍ය දෙකක් ලියන්න.
1. ප්‍රසාදය   2. ප්‍රාසාදය

II. පහත වාක්‍යයෙහි වචන **<u>දෙකක</u>** අක්ෂර වින්‍යාසය සදොස් ය. එම වචන **<u>දෙක</u>** පමණක් නිදොස් කොට ලියන්න.
මාතෘකානුකූල ව රචනා ලිවීමෙන් අදහස් නිරවුල් ව ඉදිරිපත් කිරීමේ නිපුනතාව සංවර්ධණය කර ගත හැක.

III. පහත වචන සන්ධි කොට ලියා එම සන්ධි වර්ගය නම් කරන්න.
1. ජීවන + උපාය   2. නිල් + උපුල්

IV. පහත වාක්‍යයේ සඳහන් ව ඇති උපසර්ග පද දෙකක් උපුටා දක්වන්න.
විදෙස් සංචාරකයන්ගේ ආගමනය රටට විනිමය උපයා දෙයි.

V. පහත තද කළු අකුරින් මුද්‍රිත පදවල අර්ථය වෙන වෙන ම ලියන්න.
තත මතු ද සින්දේ - **<u>පිළිමල්</u> <u>දුප</u>** ද සින්දේ

VI. පහත අදහස් වලට ගැළපෙන තනි පදය බැගින් ලියන්න.
1. යමක් හෝ යමෙකු සිහි කිරීමට තනන ලද දෙය.
2. දුර දිග බලා ක්‍රියා කිරීම.

VII. පහත සඳහන් ගේත් ගොවිතැන හා සම්බන්ධ යෙදුම් වලට ගැළපෙන පොදු භාෂා ව්‍යවහාරයේ එන අදහස ලියන්න.
1. වැදම   2. සකලයන්

VIII. පහත සඳහන් වාක්‍ය සදොස් වේ නම් ඒවා නිදොස් කර නැවත ලියන්න.
1. තැන තැන පියුම් පොකුණු වුහ.
2. අප විද්‍යාලයේ දක්ෂ සිසුන් ඇත.

IX. පහත තද කළු අකුරින් මුද්‍රිත පද අයත් වන ක්‍රියා වර්ගය නම් කරන්න.
1. වැසි **<u>වසිද්දී</u>** නාය යෑම් තර්ජන වැඩි වේ.
2. සියලු දෙනා ම මෙම පණිවිඩය **<u>පිළිගනිත්වා.</u>**

X. පහත යෙදුම්වල පළමු වචනය සමඟ දෙවන වචනය නොගැළපේ. එම වචන ගැළපෙන සේ නැවත ලියන්න.
1. විචිත්‍ර දසුන   2. දළදා මන්දිරය

(ලකුණු 2 x 10 = 20)

www.edudept.up.gov.lk

**02.** පහත දැක්වෙන (අ), (ආ), (ඉ), (ඊ) යන විස්තර අතුරෙන් එකක් තෝරාගෙන වචන 250 කට නොඅඩු වන සේ රචනයක් ලියන්න. රචනය සඳහා යෝග්‍ය මාතෘකාවක් ද යොදන්න.

(අ) මිනිසා විසින් කරනු ලබන විවිධ සංවර්ධන කාර්යයන් හේතුවෙන් වන ගහණය අඩුවීම, ස්වභාවික ව්‍යසන බහුල වීම. ඇළ මං අවහිර වීම, වගුරුබිම් ගොඩවීම, කඳුකර ප්‍රදේශ අහස් දියට නිරාවරණය වීම ආදි විවිධ හේතු නිසා ගංවතුර, නායයෑම් ආදි ස්වභාවික ව්‍යසන බහුල වෙමින් පවතී. එම විපත් අවම කර ගැනීමට ගත යුතු ක්‍රියාමාර්ග පැහැදිලි කරමින් රචනාවක් ලියන්න.

(ආ) ජන මාධ්‍යන්හි රිය අනතුරක් ගැන සඳහන් නොවන දිනයක් සොයා ගැනීමට නොහැකි තරමට වර්තමානයේ රිය අනතුරු බහුල වී ඇත. එම හේතුවෙන් විශේෂයෙන් ම තරුණ ජීවිත විශාල සංඛ්‍යාවක් රටට අහිමි වී ඇති අතර අංග විකලත්වයට පත් වන පිරිස ද අති විශාල ය. දිනපතා සිදු වන මෙම රිය අනතුරු වලට හේතු හා ඒවා අවම කර ගැනීමට සුදුසු ක්‍රියාමාර්ග අනුගමනය කිරීම ප්‍රමුඛතම කාර්යයක් සේ සලකා ක්‍රියා කළ යුතුය.

(ඉ) විවිධ පිළිකා ජනනය කිරීමේ මූලකාරකයක් වීම, ගිනි තැබීමෙන් වායු දූෂණය ඉහළ යාම, දිරා නොයෙන නිසා පාංශු දූෂණය වීම වැනි පාරිසරික හා සමාජ ගැටළු රාශියක් නිර්මාණය වීමට මූලාශ්‍රය වී ඇත්තේ පොලිතීන් භාවිතයයි. විවිධ උත්සව අවස්ථා, ආහාර ද්‍රව්‍ය රැගෙන යාම ඇතුලු නූතන සමාජ ක්‍රියාකාරකම් වලට පොලිතීන් නැතිව ම බැරි අංගයක් බවට පත් ව ඇත. එහෙත් පොලිතීන් නිෂ්පාදනය හා භාවිතය තහනම් කිරීම කාලෝචිත වැදගත් තීරණයකි.

(ඊ) ළමා අයිතිවාසිකම් උල්ලංඝනය කිරීම නූතන සමාජයේ නව ප්‍රවණතාවක් සේ ඉස්මතු වෙමින් පවතී. මල් කැකුළුවන් දරුවන් විවිධ අපයෝජන වලට ලක් කොට මරා දැමීමේ පුවත් නිතර අසන්නට ලැබේ. මෙකී ඛේදජනක තත්ත්වය නතර කිරීමට දෙමව්පියන් හා දරුවන් දැනුවත් කිරීම හා එවැනි අපරාධකරුවන්ට ඉක්මනින් නීතිය ක්‍රියාත්මක කොට දඬුවම් ලබා දීම කාලීන අවශ්‍යතාවකි.

(ලකුණු 25 යි)

03. පහත සඳහන් ඡේදය වචන 55 – 60 අතර වන සේ සාරාංශ කොට ලියන්න.

දකුණු ආසියා කලාපයේ රටවල් අතුරින් ශ්‍රී ලංකාවේ සාක්ෂරතා මට්ටම දෙවැනි වන්නේ මාල දිවයිනට පමණය. ශ්‍රී ලංකාව සංවර්ධනය වෙමින් පවතින ආර්ථික ශක්තියෙන් අඩු රටක් වුව ද වාර්ෂික ව සිය දළ ජාතික ආදායමෙන් සියයට හතරකටත් වැඩි ප්‍රමාණයක් අධ්‍යාපනය සඳහා වැය කරයි. එම නිසා අපේ රටේ සාක්ෂරතාව සියයට අනූ දෙකයි දශම පහක් තරම් ඉහළ මට්ටමක පවතින බව අතිශයෝක්තියක් නොවේ. කලාපයේ පාකිස්ථානය, නේපාලය. බංගලාදේශය හා භූතානය වැනි රටවල් සමඟ සසඳන විට එය ඉහළ මට්ටමකි. සමස්තයක් වශයෙන් ශ්‍රී ලංකාවේ සාක්ෂරතා මට්ටම දකුණු ආසියානු කලාපීය රටවල් අතුරින් ඉහළ මට්ටමක පැවතිය ද රට තුළ අධ්‍යාපන පහසුකම් ව්‍යාප්ත වීමේ ඇති විෂමතාව නිසා ප්‍රදේශ හා පළාත් අනුව සාක්ෂරතා මට්ටම්වල වෙනස්කම් දක්නට ලැබේ. ශ්‍රී ලංකාවේ ජනප්‍රිය පාසල්, විශ්ව විද්‍යාල වැඩි ප්‍රමාණයක් පිහිටා ඇත්තේ බස්නාහිර පළාත තුළ ය. එහෙත් අනෙකුත් පළාත් වලට වඩා බස්නාහිර පළාතේ සාක්ෂරතා මට්ටම ඉහළ ය. පවුල්වල ආර්ථික ශක්තිය ද සාක්ෂරතා මට්ටම්වල වෙනස්කම් ඇති කිරීමට බලපා ඇත. වැඩි ආර්ථික ශක්තියක් ඇති පවුල්වල අයට ජනප්‍රිය පාසල් තුළින් වැඩි පහසුකම් ලබා ගැනීමට ඇති හැකියාව නිසා අඩු ආදායම් ඇති අයගේ දරුවන්ට වඩා ගුණාත්මක අධ්‍යාපනයක් ලබා ගැනීමට අවස්ථාව සැලසී ඇත. මින් පැහැදිලි වන්නේ පවුල්වල ආර්ථික ශක්තිය සාක්ෂරතා මට්ටම්වල විවිධත්වයක් ඇති කිරීම කෙරෙහි බලපා ඇති බව යි.

(ලකුණු 25 යි)

04. පහත දැක්වෙන ඡේදය කියවා අසා ඇති ප්‍රශ්න වලට කෙටි පිළිතුරු සපයන්න.

කිසියම් සාහිත්‍යය කෘතියක් සාර්ථක වීමට නම් එහි රසය හා උපයෝගිතාව යන අංශ දෙක කෘතිය තුළ වෙන් වෙන් ව තිබීම පමණක් ප්‍රමාණවත් නොවේ. ඒවා සුසංයෝගී ව තිබිය යුතුය. සාහිත්‍යය රසය යනු අප විඳීමට පුරුදු නිශ්චිත රස ගණනාවකින් එකක් නො ව "උත්තරීතර රසයකි." මක් නිසාද යත් "උත්තරීතර රසය" ලැබෙනුයේ විශිෂ්ට කාර්යයක් වන නිරාමිස චිත්ත සමාධිය මගින් බැවිනි. එමෙන් ම සාහිත්‍යය කෘතියක උපයෝගිතාව එනම් එහි උපදේශාත්මක ගාම්භීර්යය රසාත්මක වූ ගාම්භීර්යයක් විය යුතුය. එය කෙනෙකු විසින් ඉටු කළ යුතු යයි සම්මත යුතුකම් හා වගකීම් පිළිබඳ ව ඉගැන්වීමට අදාළ ගාම්භීර්යයක් නො ව සෞන්දර්යමය වූ ගාම්භීර්යයක් විය යුතු ය. දුෂ්කර බන්ධන වලට ඇබ්බැහි වූවන්ට සාහිත්‍යය කෘතියක ඇති සෞන්දර්යාස්වාදය පිළිබඳ ව නොසලකා තම රුචිය හරස් පද ප්‍රහේළිකා විසඳීමේ තත්ත්වයෙන් පවත්වා ගත හැකිය. එසේ ම අධ්‍යාපනඥයෙකුට සාහිත්‍යය කෘතියක ඇති අගය එහි ඇති උපදේශ හෝ ඓතිහාසික තොරතුරු වලට හෝ සීමා කළ හැක.

1. මෙහි සඳහන් පරිදි සාහිත්‍යය කෘතියක පැවතිය යුතු ප්‍රධාන අංග කවරේ ද?

www.edudept.up.gov.lk

2. සාහිත්‍යය කෘතියක උපදේශ අඩංගු නොවිය යුතු යැයි මෙම පාඨයෙන් හැඟේ ද?
3. මේ පාඨයට අනුව සාහිත්‍ය රසය උත්තරීතර වනුයේ කවර හෙයින් ද?
4. "නිරාමිස චිත්ත සමාධිය" යන්න පැහැදිලි කරන්න.
5. දුෂ්කර බන්ධන සොයන්නන්ගේ සහ අධ්‍යාපනඥයන්ගේ කාර්යයන් සාහිත්‍ය රසාස්වාදයෙන් පරිබාහිර බවක් මෙයින් හැඟවේ ද?

(ලකුණු 10 යි)

05. මේ දිනවල ඇද හැලෙන අධික වර්ෂාවත් සමඟ බණ්ඩාරවෙල හා අවට ගම්මාන රැසක් නාය යාමේ තර්ජනයට ලක් ව තිබේ. මේ පිළිබඳ ව ප්‍රදේශවාසීන් දැනුවත් කරමින් කරුණු පැහැදිලි කිරීමට බණ්ඩාරවෙල ආපදා කළමණාකරණ මධ්‍යස්ථානය මඟින් ප්‍රකාශයට පත් කරනු ලබන දැන්වීම නිර්මාණය කරන්න.

<u>නැතහොත්</u>

පහත කරුණු වලින් අදාළ කරුණු පමණක් තෝරා ගෙන ප්‍රදේශවාසීන් අතර බෙදා හැරීමට වචන125 කින් පමණ යුතු අත් පත්‍රිකාවක් සකසන්න. (මෙහි දැක්වෙන්නේ වියදිගුන එක්සත් සුභසාධක සමිතියේ කාරක සභා රැස්වීමේ දී ඇති වූ කතාබහෙන් කොටසකි.

"අවුරුදු පතා කරන මේ කටයුත්ත මේ අවුරුද්දෙත් හොඳට කරන්නෝනෑ. "
"ඔව් ගිය අවුරුද්දේ ළමා නිවාසෙට දානයක් දුන්නා. "
"ඊට ඉස්සෙල්ලා අවුරුද්දෙ ඉස්පිරිතාලේ වාට්ටුවක් සුද්ද පවිත්‍ර කෙරුවා. "
"මේ සැරේ අපේ ගමේ පාර හදමු. "
"ඔව් පාරේ හැම තැන ම වළවල්. දෙපැත්තෙ කාණුත් වැහිලා. යම්තම් වැස්සක් ආවොත් මඩ වෙනවා. "
"ගමේ ඔක්කොම එකතු වුනොත් බැරිකමක් නැහැ.මේකට අපේ සමිතියයි පෙරමුණ ගන්න ඕන.හොඳයි ශ්‍රමදානය යොදා ගන්නවා නම් පහසු දවසක් වෙන්න ඕනෑ. "
"එහෙනම් ලබන 12 දාගමු. එදා ඉරිදා නේ. "
"8.30 වෙනකොටවත් වැඩේ පටන් ගමු. "
"කවුරු කවුරුත් උදැල්ලක්, කැත්තක්. රේක්කයක්, කූඩ වගේ ඒවා අරං එන්න ඕනෑ
"එතකොට මේකට කෑම බීම.
"සමිතියේ අරමුදලින් දෙමු.
"නරකද ප්‍රාදේශීය සභාවට කියලා මෝටර් ගේඩරයක් ගෙන්න ගත්තොත්?
"ඔව් ඒකත් නරක නැහැ. සභාපතිතුමා අපට උදව් කරයි.
"එතුමාට මේ හරියෙන් ඡන්ද හම්බ උණා නේ.
"එහෙනම් මේ ගැන ගමේ හැමෝටම කියමු.

(ලකුණු 10 යි)

www.edudept.up.gov.lk